# වැඩිහිටියන් සඳහා නොමිලේ ඇස් කණ්නාඩි ලබාදීමේ වැඩසටහන - 2024

## හැඳින්වීම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය ඉහළ නැංවීමේ අරමුණින් අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත නොමිලේ ( ඇස් පෙනීමේ දුර්වලතාවයෙන් පෙලෙන ) ඇස් කණ්නාඩි ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

## ප්‍රතිලාභීන් තෝරා ගැනීම

- ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පුරා විසිර සිටින ඇස් පෙනීමේ දුර්වලතා ඇති , වයස අවුරුදු 60 ඉක්මවූ සහ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

## අයදුම්පත් ඉදිරිපත් කිරීම

- වැඩිහිටියාගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මඟින් ලබා ගත යුතුය.
- අයදුම්කරුවන් සඳහා දෙනු ලබන්නේ BIFOCAL ( දුර පෙනෙන සහ ළඟ පෙනෙන ) වර්ගයේ ඇස් කණ්නාඩි බැවින් සහතික කරන ලද වෛද්‍ය වාර්තාව ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතුය.
- අදාල අයදුම්කරු සුදුස්සකු බවට අයදුම්පතෙහි ග්‍රාම නිලධාරි හා වැඩිහිටි විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරියා විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබිය යුතුය.

## ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිවැරදිව සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් ලැබෙන පිළිවෙල අනුව ලේඛනගත කෙරේ.
- එකවර අයදුම්පත් එකකට වඩා එවීමේදී ප්‍රමුඛතා ලේඛනයක් එවීමට කටයුතු කල යුතුය.
- ඇස් කණ්නාඩි මිළදී ගන්නා ආයතනයට අදාල දිස්ත්‍රික්ක වල පිහිටා ඇති ශාඛා  වෙත ඉල්ලුම්කර ඇති සියළුම ප්‍රතිලාභීන්ගේ වෛද්‍ය වාර්තා සමඟ යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
- එහිදී ප්‍රතිලාභියාගේ ඇස් කණ්නාඩිය සෑදීම සඳහා ඇස්වල ප්‍රමාණය මැන ගැනීමට, අදාල දිස්ත්‍රික්කයේ ශාඛාව වෙත ප්‍රතිලාභියා යොමු කිරීමට අදාල සම්බන්ධීකරණය විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරියා විසින් සිදුකල යුතුය.
- ඇස් කණ්නාඩිය සකස් කිරීමෙන් පසුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත කුරියර් සේවාව මඟින් ලබා දීමට කටයුතු කෙරේ. ඇස් කණ්නාඩි අදාල ප්‍රතිලාභියාට භාරදීමෙන් පසුව ප්‍රතිලාභීන් ලබාගත් බවට සනාථ කෙරෙන අත්සන් ලේඛනය ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයට එවීමට කටයුතු කල යුතුය.

කේ. ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ